# කුසලතාවයට සරිලන වැටුපක් නොලැබීම නිසා උගතුන්, බුද්ධිමතුන් රට හැරයාම වැඩිවෙලා



## රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ මාධ්‍ය ප්‍රකාශක වෛද්‍ය නවීන් ද සොයිසා

ලබාදෙන සේවාවට සරිලන වැටුපක් නොලැබීම නිසා ශ්‍රී ලාංකික පුහුණු ශ්‍රමිකයන් විශාල ලෙස විදේශ ගතවෙමින් තිබේ. අවාසනාවකට කරුණක් වී තිබෙන්නේ නිදහස් අධ්‍යාපනයේ පිහිටෙන් අධ්‍යාපනය හදාරා වෘත්තීය පුහුණු, සේවා පුහුණු ලබා තම රටට සේවය නොකර විදේශ ගතවීමය. මේ නිසා රට තුළ පුහුණු ශ්‍රමිකයන්ගේ විශාල හිඟයක් නිර්මාණ වෙමින් තිබේ. මේ තත්ත්වය වැඩි වශයෙන් දක්නට ලැබෙන්නේ රාජ්‍ය අංශයෙන් වන අතර, රාජ්‍ය අංශයේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ නිරත පිරිස් විදේශගතවීම අන් රාජ්‍ය අංශ සේවාවලට වඩා ඉහළ අගයක් ගනිමින් තිබේ.

■ ඉන්දික හේවාවිතාරණ

මේ ආකාරයෙන් රට හැරදා විදේශ රටවලට සේවා සැපයීම කොතරම් සාධාරණද කියා අප දන්නේ නැත. එහෙත් අපට දැනෙන එකම දේ නම් දිනෙන් දිනම සෞඛ්‍ය අංශය ඇතුළු අනිකුත් අංශවල පුහුණු ශ්‍රමිකයන්ගේ හිඟය ඉහළ යන බවය. මෙහි අනිටු විපාක අපට අනාගතයේ විඳින්නට සිදුවෙනවා නොඅනුමානය. 'අද' මේ පිළිබඳව රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ මාධ්‍ය ප්‍රකාශක වෛද්‍ය නවීන් ද සොයිසා මහතා සමග කතාබහක නිරත විය.

**Q සෞඛ්‍ය ක්ෂේත්‍රයේ නිරත පිරිස විදේශගත රැකියාවලට යොමුවීම ශීඝ්‍ර ලෙස ඉහළ ගිහිල්ලා තියෙනවා. මොකක්ද මේකට හේතුව?**

සෞඛ්‍ය ක්ෂේත්‍රයේ නිරත පිරිස් විදේශ ගතවීමට බලපාල තියෙන ප්‍රධානම කරුණ තමයි ලබාදෙන සේවාවට සරිලන වැටුපක් නොලැබීම.

**Q මේ ආකාරයට විදේශගත රැකියාවලට යොමුවීම සාධාරණ නැහැ නේද?**

ඔබ හිතන විදිහට එහෙම වෙන්න පුළුවන්. ඒ වගේම රටේ ජනතාව හිතන විදිහටත් ඒක හරි වෙන්න පුළුවන්. මේ නිසා ආණ්ඩුව තමයි හිතන්න තිබුණේ මේ ආකාරයට සෞඛ්‍ය ක්ෂේත්‍රයේ පිරිස් විදේශගත වෙන එක වළක්වා ගන්න වැඩපිළිවෙළක් සකස් කරන්න. ඒත් එහෙම වැඩපිළිවෙළක් සකස් කරලා නැති නිසා ඒක ආසාධාරණ නැහැ.

**Q ඒ කියන්නෙ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ රැකියාවල් කරන පිරිස්වලට ගෙවන වැටුප සාධාරණ නැහැ කියලද?**

ඔව්. සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සේවය කරන විශේෂඥ වෛද්‍යවරයාගේ ඉඳලා සාමාන්‍ය වෛද්‍යවරයාටත්, හෙදියටත් මීට අමතරව රසායනාගාර ඖෂධවේදීන්, විකිරණ ශිල්පීන් ඇතුළු කම්කරු, සුළු කම්කරු තනතුර දක්වා ඔවුන් ලබාදෙන සේවාවට සරිලන වැටුපක් ලැබෙන්නේ නැහැ. සමහර වෙලාවට විශේෂඥ වෛද්‍යවරයෙකුගේ වැටුපට වඩා වැටුපක් පෞද්ගලික අංශයේ රියදුරු රැකියාවක් කරන කෙනාට ලැබෙන අවස්ථා තියෙනවා. මීට අමතරව විශාල වැටුප් විෂමතාවයකුත් තියෙනවා.

**Q මොනවගේ විෂමතාවයක්ද තියෙන්නෙ?**

මේ විෂමතාවය රටවල් දෙකක් සංසන්දනය කිරීමේදීත්, ශ්‍රී ලංකාව තුළදී ශ්‍රේණි අතර වැටුප් සංසන්දනය කිරීමේදීත් විශාල ලෙස තියෙනවා. මේ නිසා වැඩිම අසාධාරණය සිදුවෙලා තියෙන්නෙ විධායක ශ්‍රේණියේ තනතුරුවලට.

**Q රටක් වශයෙන් අසල්වැසි රටවල් හා සංසන්දනය කරනවිට මොන වගේ වැටුප් විෂමතාවයක්ද තියෙන්නෙ?**

උදාහරණයක් ලෙස අසල්වැසි ඉන්දියාව ගත්තොත් වැටුප් වෙනස 1:12 ක් ලෙස පවත්වාගෙන යනවා. ඒ කියන්නේ පහළම ශ්‍රේණියේ තනතුරක වැටුප වගේ වැටුප් 12 ක් වැඩියෙන් ඉහළම ශ්‍රේණියට ලබාදෙනවා. සමස්තයක් ලෙස ලෝකයේම පොදු අගයක් සේ ගණනය කළහොත් එම ගණන 1:20 ක්. ශ්‍රී ලංකාවේදී මේ තත්ත්වය 1:4 ක්. ඒ කියන්නේ පහළම ශ්‍රේණියේ තනතුරක සේවය කරන ශ්‍රමිකයාගේ වැටුප සහ ඉහළම ශ්‍රේණියේ සේවය කරන ශ්‍රමිකයාගේ වැටුප අතර පරතරය හතර ගුණයක් පමණයි.

**Q ඒ පිළිබඳව පැහැදිලි කරනවානම්?**

ඒක පැහැදිලි කරන්න වෙන්නේ මෙහෙමයි. නුපුහුණු කම්කරුවා මූලික වැටුප ලෙස රුපියල් 11,700 ක් ලබාගන්නා විට ඉහළම ශ්‍රේණියේ (විධායක ශ්‍රේණිය) සේවය කරන පුද්ගලයා ලබාගන්නේ රුපියල් 47,000 ක් වගේ සුළු මුදලක්. මීට අමතරව ශ්‍රේණි දෙකක් අතර පවතින වැටුප් ප්‍රමාණය නිසාත් ගැටලු ඇතිවෙලා තියෙනවා. මේ නිසා සේවකයා කළකිරිලා ඉන්නෙ.

> **"නුපුහුණු කම්කරුවෙක් රුපියල් 11,700 ක් ගන්නා විට එම සේවාවෙම පුහුණු කම්කරුවෙක් ලබාගන්නේ රුපියල් 12,500 ක් වගේ සුළුමුදලක්. ඒක නිසා නුපුහුණු කම්කරුවා පුහුණ කම්කරුවෙක් වෙන්න උත්සාහ කරන්නෙ නැහැ. මොකද පුහුණු කම්කරුවෙක් වෙන්න කැපකිරීම් කරන්න වෙනවා."**

**Q ශ්‍රේණි දෙකක් අතර මොනවගේ ගැටලුද ඇතිවෙලා තියෙන්නෙ?**

ගැටලු ඇතිවෙලා තියෙන්නෙ මෙහෙමයි, නුපුහුණු කම්කරුවෙක් රුපියල් 11,700 ක් ගන්නා විට එම සේවාවෙම පුහුණු කම්කරුවෙක් ලබාගන්නේ රුපියල් 12,500 ක් වගේ සුළුමුදලක්. ඒක නිසා නුපුහුණු කම්කරුවා පුහුණ කම්කරුවෙක් වෙන්න උත්සාහ කරන්නෙ නැහැ. මොකද පුහුණු කම්කරුවෙක් වෙන්න කැපකිරීම් කරන්න වෙනවා. අනිත් එක පුහුණු කම්කරුවාට, නුපුහුණු කම්කරුවාට වඩා වගකීම් වැඩියි. ඒක නිසා රුපියල් 800 ක් වැඩිපුර ගන්න උත්සාහ කරන්නෙ නැහැ.

**Q අනිකුත් ක්ෂේත්‍රවලට මොනවගේද මේ තත්ත්වය බලපාල තියෙන්නෙ?**

උදාහරණ ලෙස ගුරුවරයෙක් ගනිමු. ඔහුට වර්තමානයේදී ලැබෙන්නේ 15,000 ක් වගේ මුදලක්. තාක්ෂණවේදියෙකුට ලැබෙන්නේ රුපියල් 16,500 ක්. වෛද්‍යවරයෙකුට ලැබෙන්නේ රුපියල් 26,000 ක් වගේ මුදලක්. මෙහෙම බැලුවොත් සාධාරණයක් නැහැ කියලා පේනවා නේද?

**Q ඇයි එහෙම කියන්නෙ?**

බලන්න නුපුහුණු කම්කරුවා රුපියල් 11,700 ක් ගන්නකොට කුසලතා ප්‍රගුණ කළ ගුරුවරයෙක්, හෙදියක් ගන්නේ රුපියල් 15,000 ක් වගේ වැටුපක්. වෛද්‍යවරයෙක් ගන්නේ 26,000 ක්. මෙහෙම බැලුවම තේරෙනව නේද සේවා කුසලතාවයක් නොසලකා හැරලා කියල.

**Q මේ නිසා මොකද වෙලා තියෙන්නෙ?**

අපි වෛද්‍යවරුන්ගෙන්ම පටන් ගමු. සාමාන්‍යයෙන් වසරකට සීමිත වෛද්‍යවරු ප්‍රමාණයක් සහ වෛද්‍යවරුන් බවට පත්කිරීමට ශිෂ්‍යයන් යම් ප්‍රමාණයක් විදේශ රටවලට යවනවා වැඩිදුර පුහුණුවට සහ අධ්‍යාපනය ලැබීමට. එලෙස රට යන ප්‍රමාණයෙන් ආපසු ලංකාවට එන්නේ 50% ක් වගේ ප්‍රමාණයක්. මෙම 50% ක ප්‍රමාණයෙනුත් ටික දෙනෙක් මේ රට තුළ සේවය කරලා, එම ප්‍රමාණයෙනුත් බහුතර පිරිසක් විදේශගත වෙනවා.

**Q අනෙකුත් ක්ෂේත්‍රවල මේ තත්ත්වය මොනවගේද?**

අනෙකුත් ක්ෂේත්‍රවල විශාල පිරිසක් අධ්‍යාපනය ලබාගැනීමට විදේශගත නොවුණත් ශ්‍රී ලංකාව තුළ අධ්‍යාපනය හදාරා වෘත්තීය පුහුණුව ලබාගත් විශාල පිරිසක් සෑම වසරකදීම විදේශගත වෙනවා. මෙම ප්‍රමාණය සංඛ්‍යා වශයෙන් ඉදිරිපත් කරන්න නොහැකි වුණත්, සෑම වසරකදීම බහුතර පිරිසක් රට හැරයනවා.

**Q මෙලෙස රට හැර යන පිරිස මොනවගේ ක්ෂේත්‍රවලට අයත් අයද?**

සෞඛ්‍ය ක්ෂේත්‍රය හැරුණාම ගණකාධිකරුවන්, ගෘහ නිර්මාණ ශිල්පීන්, නගර නිර්මාණ ශිල්පීන් විශාල ලෙස විදේශ රටවල සේවයට යනවා. මේ නිසා වරලත් ගණකාධිකාරීවරු, වරලත් ගෘහ නිර්මාණ ශිල්පීන්, වරලත් නගර නිර්මාණ ශිල්පීන්, රාජ්‍ය අංශයේ සේවය කරන්නේ බොහොම අල්ප ප්‍රමාණයක් පමණයි.

මේ නිසා රටේ ජනතාවට මොවුන්ගෙන් සේවාවක් ලබාගන්න වුණොත් විශාල මුදලක් ගෙවලා පෞද්ගලික අංශයෙන් සිදුකරගන්න වෙලා තියෙනවා.

**Q මේ තත්ත්වය නැති කරගන්න මොනවගේ වැඩපිළිවෙළක්ද ක්‍රියාත්මක කරන්න ඕන?**

අඩුම වශයෙන් වැටුප් පරතරය 1:12 ක් වගේ පරතරයකට පත්කරන්න ඕන. එහෙම උනාම පහළම ශ්‍රේණියේ ඉඳලා ඉහළම ශ්‍රේණිය දක්වා හොඳ වැටුප් ක්‍රමයක් ඇතිවෙනවා. ඒ වගේම එහෙම ක්‍රමයක් ඇතිවීමත් සමග හොඳ පුහුණු කම්කරුවන් බිහිවෙන එකත් විශාල ලෙස සිදුවේවි.

**Q 1:12 ක් අනුපාතිකයක් ඇති කළාම මොනවගේ වෙනසක්ද සිදුවන්නේ?**

එහෙම උනොත් නුපුහුණු සේවකයා රුපියල් 15000 ක් ගන්නකොට පුහුණු සේවකයාට රුපියල් 25000 ක් ගන්න පුළුවන්. පුහුණු සේවකයා රුපියල් 25000 ක් ගන්නකොට අධ්‍යාපනයේ කුසලතාවයන් ප්‍රගුණ කළ හෙදියකට සහ ගුරුවරයෙකුට රුපියල් 45,000 ක වැටුපක් ගන්න පුළුවන්. මීට අමතරව වෛද්‍යවරයෙකුට රුපියල් 90,000 කට අධික වැටුපකට හිමිකම් කියන්න පුළුවන්කමක් තියෙනවා.

**Q මෙවැනි දෙයක් ක්‍රියාත්මක නොවුණොත් මොන වගේ තත්ත්වයක් ඇති වේවිද?**

එහෙම උනොත් වෙන්නේ දැනට ලබාදෙන සේවයට සරිලන වැටුපක් ලැබෙන්නෙ නැහැ කියලා විදේශගත වන පිරිසට අමතරව තවත් විශාල පිරිසක් විදේශ ගත රැකියාවලට යාමයි. ඒ තුළින් සිදුවන්නේ ශ්‍රී ලංකාව තුළ උගතුන්, බුද්ධිමතුන් පිරිසක් නොමැතිවීම.